www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ජනාධිපති සාම දූතයකු ලෙස පෙනී සිටියි

## Sri Lankan president postures as a peacemaker

**කේ. රත්නායක විසිනි**

**2006 ජුලි 08**

රට සිවිල් යුද්ධයක් කරා ඇදවැටෙද්දී ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ විකාර රූපී ලෙස සාම දූතයකුගේ ඉරියව්ව ගනිමින් අඟහරුවාදා ඉන්දියානු එන්ඩීටීවී රූපවාහිනියේ පෙනී සිටියේ ය. කොළඹ මාධ්‍යයන් මගින් පුලුල් ආවරනයක් ලැබුනු ඔහුගේ අදහස් දැක්වීම් සැලසුම් කෙරී ඇත්තේ, තම ආන්ඩුවේ යුද සූදානම වහංගු කිරීමටත් ජාත්‍යන්තර සහාය, විශේෂයෙන් ම අසල්වැසි ඉන්දියාවේ සහාය, ගොනු කර ගැනීමටත් ය.

පසු ගිය නොවැම්බරයේ බලයට පැමිනි තැන් සිට ම, රාජපක්ෂ, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය ද මිලිටරිය හා ආන්ඩුවට හිතපක්ෂපාතී පැරා- මිලිටරි කන්ඩායම් ද අතර උත්සන්න වන ගැටුමකට මූලිකත්වය දී තිබේ. 2002 සටන් විරාමය සංශෝධනය කිරීමේ යෝජනාවක් සාකච්ඡා මේසය මත තබන ලෙස සිය සිංහල අන්තවාදී සගයන් කල ඉල්ලීම්වලට හිස නැමීම මගින් ඔහු පෙබරවාරියේ ජිනීවාවල පැවති සාම සාකච්ඡාවලට වල කැපී ය. එතැන් සිට එල්ටීටීඊ කේඩර හා ආධාරකරුවන් ප්‍රකෝපකාරී ලෙස මරා දැමීම, තව දුර සාකච්ඡා අවහිර කරමින්, තීව්‍ර හා වඩ වඩා විවෘත ප්‍රචන්ඩත්වයකට මග පාදා ඇත.

මිලිටරිය කරුනා කන්ඩායම සහ එල්ටීටීඊ විරෝධී සෙසු සන්නද්ධ කන්ඩායම් සමග සහයෝගීව කටයුතු කරන්නේ ය යන කරුන එන්ඩීටීවී සම්මුඛ සාකච්ඡාව තුල දී රාජපක්ෂ යලිදු වතාවක් නිර්භයව ප්‍රතික්ෂේප කලේ ය. "එල්ටීටීඊයේ මොනම කන්ඩායමකට හෝ කරුනා පාර්ශ්වයට හෝ වෙනත් කිසිවෙකුට ආයුධ අතැතිව (මිලිටරි ) පාලන ප්‍රදේශවලට පැමිනිය නොහැක." යනුවෙන් ඔහු ප්‍රකාශ කලේ ය.

එල්ටීටීඊ ආධාරකරුවන් ඝාතනයේ දී අසන්නද්ධ හමුදාවන් පැරා මිලිටරි කන්ඩායම් ගනනාවක් විවෘතව හවුල්වීම පිලිබඳව ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව (එස්එල්එම්එම්) සහ වෙනත් ආයතන සාක්ෂ්‍ය එකතු කර ඇති තතු යටතේ, මෙම මුසාව වඩ වඩා එලිදරව් වෙමින් පවතී. කරුනා කන්ඩායම මිලිටරියේ ආරක්ෂාව ඇතිව නැගෙනහිර ප්‍රදේශයේ දේශපාලන කාර්යාලයක් පවත්වා ගෙන යන අතර පාලක සභාගයට ඇතුලත් ඊලම් මහජන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (ඊපීඩීපී) සන්නද්ධ කන්ඩායම් කයිට්ස් දූපත අසල ඝාතනයන්ට සම්බන්ධිත බවට චෝදනා ලැබ සිටිති.

එන්ඩීටීවී නිවේදකයා මෙසේ කෙලින් ම විමසුවේ යඃ "ප්‍රකාශිත ආස්ථානයන්ගෙන් ඔබ්බට යන්නේ කෙසේද කියා එක් පාර්ශ්වයකටවත් (ආන්ඩුව සහ එල්ටීටීඊය) පැහැදිලි සංකල්පයක් නැතැයි ජාත්‍යන්තර ප්‍රජාව තුල එක්තරා ප්‍රමානයක සැකයක් පවතී. ඔබට මාර්ග සිතියමක් හෝ දල සැකැස්මක් වත් තිබේද?"

රාජපක්ෂ තව බොරුවකින් පිලිතුරු දුන්නේ ය. පෙබරවාරි සාකච්ඡාවල දී ඔහුගේ නක්ඩායම විසින් කිසිදු අර්ථාන්විත සාකච්ඡාවක් ඇතිවීම වලක්වා ලනු ලැබීම නොතකා ඔහු පහසුවෙන් ම මෙසේ ප්‍රකාශ කලේ යඃ "ඔවු, සත්තකින්ම අප විද්වත් කමිටුවක් පත් කර ඇත." දේශපාලන බලය සීමිතව බෙදා හැරීම ඇතුලත් වන, 20 අවුරුදු සිවිල් යුද්ධයට විසඳුමක් කෙටුම්පත් කිරීමට "සිංහල දෙමල මුස්ලිම් නියෝජිතයන්, බුද්ධිමතුන්, නීතිඥයන්, ආන්ඩුවේ සේවකයන් පවා" සහභාගි වී සිටින්නේ යැයි පැහැදිලි කිරීමට ඔහු පෙරට ගියේ ය.

මෙම "මාර්ග සිතියම" පිලිබඳ කුමන හෝ විමසා බැලීමක් තුලින් එය දේශපාලන වංචාවක් බව වහාම එලිදරව් වෙයි. මෙම කමිටුව ස්ථාපිත කෙරුනේ ජූනි 2 වන දා රාජපකෂ විසින් කොලඹ දී කැඳවනු ලැබූ සර්වපාක්ෂික සමුලුවකින් අනතුරුව ය. අනෙක් අතට සමුලුව පැවතුනේ ඊනියා සාම ක්‍රියා දාමය අධීක්ෂනය කරන ශ්‍රී ලංකාවට ආධාර දෙන කන්ඩායමේ සම සභාපතිවරුන්ගේ - එක්සත් ජනපදය, යුරෝපා සංගමය, ජපානය සහ නෝර්වේ - රැස්වීමකින් යන්තම් දින දෙකකට පසුව ය. සම සභාපතිවරු, ආන්ඩුව හා එල්ටීටීඊය යන දෙපාර්ශ්වයම පිලිබඳව විවේචනාත්මක වූ අතර ප්‍රචන්ඩත්වය නවතා සාකච්ඡා අරඹන ලෙස ඉල්ලා සිටියහ.

කමිටුව සහ "මාර්ග සිතියම" වනාහි ආන්ඩුව එල්ටීටීඊය සමග කිසිදු සම්මුතියක් ප්‍රතික්ෂේප කරද්දී පවා සම සභාපතිවරු තම පාර්ශ්වයෙහි තබා ගැනීමේ විච්චූර්න පියවරකට වඩා වැඩි යමක් නො වේ. කමිටුවේ නායකත්වයට රාජපක්ෂ පත් කර ඇත්තේ එල්ටීටීඊයට දැඩි මතධාරී විරුද්ධත්වයක් පෑම පිලිබඳව කුප්‍රකට ප්‍රමුඛ නීතිඥයකුවන එච්.එල්. ද සිල්වා ය. ඊට

සම්බන්ධිත උපදේශක මන්ඩලය තුල රාජපක්ෂගේ සිංහල ස්වොත්තමවාදී සගයන් - ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ ජාතික හෙල උරුමය ඇතුලු බොහෝ පාර්ලිමේන්තු පක්ෂවල නියොජිතයෝ සිටිති. බ්‍රහස්පතින්දා ජවිපෙ බලය බෙදීමේ සැලැස්මක් සැකසීම 'අර්ථවිරහිත' සහ 'වැදගැම්මකට නැති' දෙයක් ලෙස විස්තර කොට එම යොජනාව අතහැර දමන ලෙස රාජපක්ෂගෙන් ඉල්ලා සිටියේ ය.

රාජපක්ෂගේ සම්මුඛ සාකච්ඡාවේ ඉතාමත්ම මුග්ධ අංශය වූයේ තමන්ගේ ම යෝජනා ඉදිරිපත් කරන ලෙස ඔහු එල්ටීටීඊයට කල ආයාචනය යි. අති උදාර ජනාධිපති වරයකු ලෙස පෙනී සිටිමින් ඔහු මෙසේ ප්‍රකාශ කලේ ය. "ඔවුන්ට යමක් දී දැන් ඕක කාපල්ලා යයි කීමට හෝ ඔවුන්ව හිරවන මුල්ලකට තල්ලු කර උඹලාට මේක පිලිගන්න සිදු වනවා යයි කීමට මට ඕන නැහැ... එල්ටීටීඊයත් ඇවිත් සමස්ත ක්‍රියාදාමයට සහභාගී වුනා වේ."

අතීතයේ දී ප්‍රශ්නය වූයේ කිසිදු බලය බෙදීමේ යෝජනාවකට සහාය දීම එල්ටීටීඊය ප්‍රතික්ෂේප කිරීම බව ජනාධිපති ප්‍රකාශ කලේ ය. 1987 දී ඉන්දු ලංකා ගිවිසුම යටතේ පලාත් සභා පිහිටුවීම පිලිබඳවත් 2000 දී හිටපු ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංගගේ ව්‍යවස්ථා සංශෝධන සැලසුම් පිලිබඳවත් ඔහු විශේෂයෙන් සඳහන් කලේ ය.

සෑම කරුනක්ම සාවද්‍ය ය

ඉන්දු-ලංකා ගිවිසුම යනු එල්ටීටීඊය නිරායුධ කිරීමටත් දෙමල සුලුතරයෙන් මතුවන කිසියම් විරුද්ධත්වයක් වෙතොත් එය මර්දනය කිරීමටත් ශ්‍රී ලංකාවේ උතුරට හා නැගෙනහිරට ඉන්දියානු සාම සාධක හමුදා ගෙන ඒම පිනිස එක්සත් ජාතික පක්ෂය විසින් අත්සන් තැබුනු ගිවිසුමකි. පලාත් සභා යනු මුල දී ගිවිසුම පිලිගෙන ඉන් අනතුරුව පමනක් ඉන්දියානු මිලිටරිය සමග ගැටුමට එලඹුන එල්ටීටීඊයට දෙන ලද ඇමති රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) ජවිපෙ සමග එක්ව, ගිවිසුම ජාතිය පාවාදීමක් ලෙස එයට දැඩි ලෙස විරුද්ධත්වය පෑවේ ය. ජවිපෙ ගිවිසුමට එරෙහිව විෂසෝර වර්ගවාදී උද්ඝෝසනයක් දියත් කොට සිය ගනනේ මරා දමමින් දේශපාලන විරුද්ධවදීන්ට එරෙහිව සිය ෆැසිස්ට් මැරයන් මුදා හැරියේ ය.

2000 දී එල්ටීටීඊය මිලිටරිය මත ව්‍යසනකාරී පරාජයන් මාලාවක් පැටවීමෙන් අනතුරුව, කුමාරතුංග දෙමල සුලුතරයට කිසියම් සහනයක් සලසන ව්‍යවස්ථා සංශෝධන යෝජනා කරමින් සාම සාකච්ඡා සඳහා පදනමක් ස්ථාපිත කිරීමට වෑයම් දැරී ය. එය වෙන ම රාජ්‍යය කැබැල්ලක් සඳහා වන එල්ටීටීඊයේ ඉල්ලීමට යටත් වීමේ සැලැස්මකයි. හෙලා දකිමින් ජවිපෙ, යලිදු වතාවක් යෝජනාවන්ට විරුද්ධ වීය. ජවිපෙ ස්වෝත්තමවාදී උද්ඝෝෂනයේ පීඩනය යටතේ එජාපය ව්‍යවස්ථා සංශෝධනයට දන් සිය සහාය අතහැර දැමූ අතර යෝජනාවට වල කැපීමට මාන බැලූ ශ්‍රීලනිපය ඇතුලතින් පැන නැගුනාවූ විරුද්ධ කන්ඩායමකට රාජපක්ෂ නායකත්වය දුන්නේ ය. 1987 හෝ 2000 හෝ එකදු යෝජනාවක් වත්, රටේ වර්ගවාදී ව්‍යවස්ථාව තුල එහි ප්‍රකාශනය අත්කරගන්නා ක්‍රමානුකූල දෙමල විරෝධී වෙනස් කිරීම්වලට අවධානය යොමු කලේවත් නැත.

එල්ටීටීඊයට ඔවුන්ගේ ම යෝජනා ඉදිරිපත් කරන ලෙස රාජපක්ෂ කරන ඉල්ලීම පිලිබඳව සලකන්නේ නම්, දැනට මේසය මත තිබෙන එකම සැලසුම, වනුයේ උතුරේ සහ නැගෙනහිර අන්තර්වාර පාලනයක් සඳහා වන යෝජනාව ය. අවසානයේ යුද්ධය අවසන් කරනු පිනිස බලය බෙදාගැනීමේ ගනුදෙනුවකට මග පාදනු ඇති සාකච්ඡා යලි ඇරඹීමේ පදනම ලෙස 2003 අග භාගයේ දී එල්ටීටීඊය විසින් මෙම යෝජනා ඉදිරිපත් කරනු ලැබීය. ජවිපෙ සහ මිලිටරිය විසින් පොලඹවනු ලැබ, කුමාරතුංග මීට ප්‍රතිචාර දැක්වූයේ, ඊට දින කීපයකට පසු ප්‍රධාන එජාප ඇමතිවරු තිදෙනෙකු නෙරපා හරිමින් හා හදිසි නීතිය පැනවීම දෙසට පියවර ගනිමිනි. තුන් මසකට අනතුරුව ඇය මුලු ආන්ඩුව ම පලවා හැර ජවිපෙ සමග මැතිවරන සන්ධානයක් අටවා ගෙන 2004 අප්‍රේල් මැතිවරනය ජය ගත්තා ය. අන්තර්වාර පාලනයක් සඳහා වූ එල්ටීටීඊ යෝජනාව කිසි දාක සාකච්ඡාවට ගෙන නැත.

තමන් එල්ටීටීඊය මුල්ලකට තල්ලු කර දමා යුද්ධයක් අවුලුවා ගැනීමට වෑයම් නොකරන බව රාජපක්ෂ කියා පෑව ද, නොවැම්බරයේ දී නිලයට පත් වීමේ සිට ඔහුගේ මූලෝපාය වූයේ එය ම ය. ඔහුගේ සුලුතර ආන්ඩුව පාර්ලිමේන්තු සහාය සඳහා රැඳී පවතින ජවිපෙට හා හෙල උරුමය යොදන පීඩනය යටතේ, ඔහු 2002 සටන් විරාමය යලි සලකා බැලීමට බල කල අතර සාම ක්‍රියාවලියේ නිල පහසුකම් සපයන්නා වන නෝර්වේ රාජ්‍යය පිලිබඳව වඩ වඩා විවේචන ශීලී වී ඇත. සාම සාකච්ඡාවල පූර්ව පදනම සෘජුව කපා දමමින් උතුරු නැගෙනහිර ඇතිවන ඕනෑ ම එල්ටීටීඊ පාලනයකට හිමිවන බලතල ඉතා සීමිත බව සහතික කරමින් ද ඔහු කෙලින්ම අවධාරනය කර ඇත්තේ, ඕනෑ ම බලය බෙදීමක් "ෆෙඩරල්" රාජ්‍යයක් නොව ඒ වෙනුවට "ඒකීය" රාජ්‍යයක් ඇතුලත සිදු වන බවයි.

රාජපක්ෂගේ එන්ඩීටීවී සම්මුඛ සාකච්ඡාව පැවැත්වූයේ ඉන්දියාව විදේශ ලේකම් ශ්‍යාම් සරන්ගේ දෙදින සංචාරයක් මධ්‍යයේ ය. සටන් විරාමය දිගටම පවත්වා ගෙන යාම හා යලි සාකච්ඡා ඇරඹීම පිලිබඳව ආයාචනා කරන අතරේ ම, සිය "ආරක්ෂක සහයෝගිතාව ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවල නිවාරක ධාරිතාව ගොඩනැගීම කෙරෙහි යොමුව තිබේ." යයි පවසමින් ඉන්දියාව කොලඹ මිලිටරි ආධාර සම්පාදනය

කරනු ඇති බව ද සරත් ඇඟවී ය. නව දිල්ලියේ මිලිටරි සහයෝගය - යුද්ධය වැලැක්වීමට මැදිහත් වන ලෙස දේශපාලන පක්ෂ විසින් ඉන්දියානු ආන්ඩුවෙන් ඉල්ලා සිටිනු ලබන, දකුනු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තය තුල විශේෂිතව  විරෝධතා ඇවිලී යාමක් පිලිබඳ තර්ජනය මතු කරයි. එබැවින් ශ්‍රී ලංකා ජනාධිපති, අස්වසාලීමේ බොරු ටිකක් හා හිස් පොරොන්දු ටිකක් දීමට ඉන්දියානු රූපවාහිනියේ පෙනී සිටියේ ය.

යථාවසයෙන් ගත් කල ආන්ඩුව හා මිලිටරිය සිය යුද සූදානම තීව්‍ර කරමින් සිටී. ජූනි 26 වන දා ලුතිනන් ජෙනරාල් පාරමී කුලතුංග මරා දැමීමේ  තැන් සිට, මිලිටරිය සෝදිසි ස්ථාන, හැඳුනුම්පත් පරීක්ෂාව සහ ආන්ඩුවේ පාලන ප්‍රදේශවලට එන හෝ එල්ටීටීඊ පාලන ප්‍රදේශවලට යන සියලු භාන්ඩ පරීක්ෂාව ඇතුලු පූර්ව-සටන් විරාම සීමා බන්ධන යලි පනවා ඇත.

පසු ගිය සතියේ *සන්ඩේ ටයිම්ස්* පුවත්පතේ ලිපියක් මෙසේ පැහැදිලි කලේ යː "පූර්න පරිමාන යුද්ධයක තර්ජනය ලඟදෙන තතු යටතේ දී හදිසි සූදානම් වීම් කල යුතු ය. අලුත් මිලිටරි උපකරන වහවහා ගෙන්වනු ලැබේ. ප්‍රහාරවලට මුහුන දීමට හදිසි සටන් සැලසුම් සැකසෙමින් තිබේ. ගරිල්ලා පාලිත ප්‍රදේශවලට මායිම්වූ ගම්මානවල ආරක්ෂක සූදානම් දැඩි කෙරෙයි. ඒවා 'මායිම් ගම්මාන' නොව 'තර්ජනයට ලක් වූ ගම්මාන' ලෙස පමනක් හඳුන්වන ලෙස ආරක්ෂක හමුදාවන්ට ආන්ඩුව මේ සතියේ අන කර තිබේ. මාර්ග වසා දමා රටේ විවිධ ප්‍රදේශවල සෝදිසි ස්ථාන ස්ථාපිත කර තිබේ."

ආරක්ෂක හේතු මත කොලඹ වසන සියලු දෙනා ලියාපදිංචි කිරීම ද සැලසුම්වලට ඇතුලත් ය. "ත්‍රස්ත තර්ජනවල" ප්‍රතිඵලයක් ලෙස මෙම විස්තර අවශ්‍ය බව ද ඒවා ජනාධිපති ලේකම් කාර්යාලයේ කේන්ද්‍රගත කර තබන බව ද කොලඹ බාර නියෝජ්‍ය පොලිස්පති පූජිත ජයසුන්දර පසු ගිය සතියේ දී නිවේදනය කලේ ය. අනෙකුත් ප්‍රදේශවල ද මෙම විධිවිධාන ක්‍රියාත්මක කරන බව ද ඔහු ඇඟවී ය.

රාජපක්ෂ සාමයේ ධජය යටතේ රට යුද්ධය වෙතට ඇද දමමින් සිටී.

© www.wsws.org